# ආණ්ඩුවේ මූල්‍ය ප්‍රතිපත්තියට මූල්‍ය අරමුදලේ නොසතුට



ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ ඩොලර් බිලියන 2.5 ණය මුදලෙන් තුන්වන කොටස වන ඩොලර් මිලියන 388 ශ්‍රී ලංකාවට ලබාදීම පමා කිරීම මේ දිනවල ආර්ථික විද්වතුන්ගේ හා කාගේත් කතා බහට මාතෘකාවක් වී තිබේ. එම තත්ත්වයට හේතු වූ පසුබිම පිළිබඳ මහ බැංකුවේ හිටපු උසස් නිලධාරියකු වන ආර්ථික විශේෂඥවරයෙකු හා පවත්වන ලැබූ සාකච්ඡාවක් පහත පළවේ. එම ආර්ථික විශේෂඥවරයා පවසන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා එකඟ වූ කොන්දේසි ඉටු කිරීමට ආණ්ඩුව අසමත්වීම මෙන්ම ආණ්ඩුවේ අවිධිමත් මූල්‍ය ප්‍රතිපත්ති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අසතුටට හේතුවී ඇති බවයි.

දැනට ශ්‍රී ලංකාවට පැමිණ සිටින ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (අයි.එම්.එෆ්.) නියෝජිතයන් විසින් පසුගියදා වාර්තාවක් නිකුත් කරනු ලැබිය. ඔවුන් පැමිණියේ ශ්‍රී ලංකාවට සපයන ඩොලර් බිලියන 2.5 වන ණය මුදලේ තුන්වන වාරිකය ලබාදීමට පෙර කළ යුතු, ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ අධ්‍යයනය සඳහාය.

මහ බැංකුව පසුගිය සති තුනේ (2009) රාජ්‍ය ආදායම්-වියදම් සංඛ්‍යාලේඛන නිකුත් නොකර ප්‍රමාද කළ බව රහසක් නොවේ. එසේ කළේ රජයේ මූල්‍ය ප්‍රතිපත්තියේ දුර්වල හා අවිධිමත් බව රටට හා ලෝකයාට හෙළිවීම වැළැක්වීමටයි. විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ඇති කරගත් කොන්දේසි අනුව 2009 අය-වැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් 7% ලෙසද 2010 වන විට 6.5% මට්ටමට ද ගෙන ආ යුතුවේ. එය කළ යුතුව ඇත්තේ රජයේ වියදම් අඩු කිරීමෙන් හා ආදායම් වැඩි කිරීමෙනි. එහෙත් ඒ දෙකම කරන්නට ආණ්ඩුව අසමත් වීම නිසා අදාළ ගණන් හිලවු ඉදිරිපත් කිරීම පවා කරන ලදී.

මේ නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ දිගුකාලීන හා කෙටිකාලීන ණය ප්‍රමාණය ගණන් බලා ඒ මගින් ආණ්ඩුවේ මූල්‍ය හිඟය ගණනය කරන ලදි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අප එසේ කරති යැයි ආණ්ඩුව හෝ මහ බැංකුව මොහොතකටවත් සිතුවේ නැත. ආණ්ඩුවේ ණය ගණන් බැලීම නිසා අය-වැය පරතරයට වඩා වැඩි ප්‍රමාණයක රාජ්‍ය මූල්‍ය හිඟකමක් අරමුදලේ විශේෂඥ යන්ගෙන් සංඛ්‍යාලේඛනවලට ඇතුළත් විය.

සාමාන්‍යයෙන් ණයක් ගත් විට එම මුළු මුදලම වියදම් නොකෙරේ. කොටසක් යම් ප්‍රමාණයක් වියදම් කර අනෙක් ප්‍රමාණය වත්කම් ලෙස රඳවා ගනී. ශ්‍රී ලංකා මහබැංකුවේ අධිපති නිවාඩ් කබ්රාල්, 2009 නොවැම්බර් වන විට ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් ප්‍රමාණය ඩොලර් බිලියන 3.2 සිට ඩොලර් බිලියන 5.2 දක්වා වැඩිවී ඇතැයි ප්‍රකාශ කළේ ඒ අනුවය. එහෙත් දැන් ඒ රඳවා ගැනීම් සංචිතයද ණය ලෙස අයි.එම්.එෆ්. සාමාජිකයන් විසින් ගණන් බලා තිබේ.

අයි.එම්.එෆ්. අරමුදලේ කොන්දේසි අතර ඉතාම වැදගත් කොන්දේසියක් වූවේ ආණ්ඩුව සංවර්ධනාත්මක ණය හා වියදම් පාලනය නොකෙරේ නම් පුනරාවර්තන වියදම් (RECURRENT EXPENDITURE) පාලනය කර ගත යුතු බවයි. එසේම බැංකුවලින් ණය ගැනීම අඩු කළ යුතු බවටද කොන්දේසියකි. එහෙත් රාජපක්ෂ ආණ්ඩුවට මේ දෙකම කළ නොහැකි විය. මන්ද යත් රටේ ආර්ථික කළමණාකරනය, දේශපාලන ඕනෑ එපාකම් හා පටලවා ගත් හෙයිනි. 2009 නොවැම්බර්වල මහ බැංකුව ඉදිරිපත් කළ වාර්තාවකින් මේ කනපිට හැරුණු තත්ත්වය මොනවට දැකබලා ගත හැකිවීමත්. එම ප්‍රකාශයේ කියැවෙන්නේ 2009 වසරේ පුනරාවර්තන වියදම් (RECURRENT EXPENDITURE) ඇස්තමේන්තුව රුපියල් බිලියන 823.5 ප්‍රමාණය රුපියල් බිලියන 812.11 දක්වා එනම් රුපියල් බිලියන 114 කින් (කෝටි 1140 කින්) අඩු කිරීමට සැළැසුම් කරන ලද බවයි. එසේ වුවත් පොලිය, වැටුප් හා ණය ගෙවීම් ඉහළ යෑමෙන් මේ ඉලක්කය සපුරාගත නොහැකි වී යයි එම වාර්තාවේ සඳහන් වේ. 2009 පළමු මාස නවය තුළ පුනරාවර්තන වියදම පසුගිය වසරේ (2008) මුල් මාස නවය හා සසඳා බලන විට රුපියල් බිලියන 661.5 දක්වා 26% කින් ඉහළ නැග තිබෙන බව මහ බැංකු වාර්තාවේ දැක්වේ. 2009 අවසන් මාස තුනේ අදාළ විස්තර මහ බැංකුව නිකුත් කළේ නැත.

අපට පැහැදිලි වන්නේ පුනරාවර්ත වියදම් (වැටුප්, ඉන්ධන, ගොඩනැගිලි කුලී, වාහන ගාස්තු, විදුලි හා දුරකථන ගාස්තු, දීමනා ආදි) අඩු නොකර වැඩි කිරීමේ අවිධිමත් සහගත රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අසතුටට හේතු වූ බවය. ඒ බව ඔවුන් විසින් පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවේදී ද (පෙබරවාරි 23) ප්‍රකාශ කරන ලදී.

ඊළඟට බැංකුවලින් ණය ලබාගැනීමේ පාලනයක් කර ගැන්මට ආණ්ඩුව හා මහ බැංකුව අසමත් වීමද මගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ එකඟවූ කොන්දේසියද කඩා බිඳ දමා තිබේ. 2009 අවසානයේ මහින්ද රාජපක්ෂ මුදල් ඇමැති ලෙස ඉදිරිපත් කළ පරිපූරක අය-වැය (මාස හතරේ අය-වැය) මගින් කියා සිටියේ 2010 දී 6% න් හා 2011 දී 5% කින් බැංකුවලින් ණය ලබා ගැනීම පාලනය කරන බවකි. මේ හිඟ අඩුපාඩුව පිරිමසා ගන්නට බදු ගෙවන්නන්ගේ ප්‍රමාණය ලක්ෂ තුනේ සිට ලක්ෂ පහ දක්වා වැඩිකරන්නට අපේක්ෂා කරන බවද සඳහන් කරන ලදී. 2009 නොවැම්බර් 17 දා පාර්ලිමේන්තුවට නියෝජ්‍ය මුදල් ඇමැති රංජිත් සියඹලාපිටිය ඉදිරිපත් කළ යෝජනාවකින් මේ තත්ත්වය හාත්පසින්ම වෙනස් වූ බව පැහැදිලි විය. එහිදී රාජ්‍ය ණය ගැනීමේ සීමාව රුපියල් කෝටි 21 000 කින් වැඩි කිරීමට යෝජනා කරන ලදී. ඒ අනුව රජයේ ණය ගැන්මේ සීමාව රුපියල් කෝටි 84,000 සිට රුපියල් කෝටි 1,05,000 දක්වා වැඩිවනු ඇත.

පොලී ප්‍රමාණය පහත වැටීම හා රටේ අභ්‍යන්තර ආර්ථික පීඩන තත්ත්වය නිසා ආණ්ඩුවට විවෘත වෙළෙඳපොළෙන් ණය ලබා ගැන්ම දැන් අසීරුය. ලබාගත හැකි එකම මාර්ගය වන්නේ බැංකු මගින් පමණි. එවිට පොලී ප්‍රමාණය අධික වේ. භාණ්ඩාගාර බිල්පත් හරහා කෙරෙන මෙම ණය ගනුදෙනුවේ අවසානය වන්නේ විශාල මුදල් නෝට්ටු ප්‍රමාණයක් අලුතෙන් වෙළෙඳපොළට මුදාහැරීමය. එය ඍජු ලෙසට භාණ්ඩ හා සේවා මිල වැඩිවීම වේගවත් කිරීමට (උද්ධමනය වැඩිවීමට) හේතු වනු ඇත. අරමුදලේ නියෝජිතයන් බැංකුවලින් ණය ලබාගැන්ම සීමා කරන ලෙස උපදෙස් දෙමින් කියා සිටියේ රටේ උද්ධමනය පාලනය කළ යුතු බවත් බැංකු මගින් ණය ලබා ගැන්ම සීමා කිරීමෙන් එය කළ යුතු බවත්ය. රජයේ වියදම් අඩු කිරීම සඳහා වූ ඔවුන්ගේ යෝජනාව තුළ මේ බැංකු ණය ගනුදෙනුවද ඇතුළත් විය.

මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල්, 2009 නොවැම්බර් 22 දා සිළුමිණ පුවත්පතට සම්මුඛ සාකච්ඡාවක් දෙමින් කියා සිටියේ රාජ්‍ය ණය බර (දළ දේශීය නිෂ්පාදිතයෙන්) 102% ට තිබියදී දැන් එය 81% දක්වා පහත දමා ඇති බවය. එහෙත් එය සම්පූර්ණයෙන්ම පදනම් රහිත ව්‍යාජ ප්‍රකාශයක් බව පැහැදිලිය. (නොවැම්බර් 17 රංජිත් සියඹලාපිටිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව හා යෝජනාව) මීට අමතරව බරපතළම ප්‍රශ්නය නම් ඒ වනවිටත් ආණ්ඩුව දිගුකාලීන හා කෙටිකාලීන ණය ගොහොරුවක එරී සිටියදී තව තවත් කෙටි කාලීන ණය ලබා ගැන්මේ යෙදී සිටීමයි. මේ වනවිට එනම් 2010 මැයි මාස වලදී ඩොලර් මිලියන 500 ක් ලබා ගැන්මට මහ බැංකු අධිපතිවරයා පසුගියදා බ්‍රිතාන්‍යයේ සංචාරය කළේය. එකට එකක් පරස්පරවූ ව්‍යාජ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමින් මහ බැංකුව ගෙන ගිය සෙල්ලම තවදුරටත් ගෙන යෑමට නොහැකි තැනට දැන් පැමිණ අවසානය.2009 අවසන් මාස තුනේ රාජ්‍ය ආදායම් වියදම් සංඛ්‍යා ලේඛන ප්‍රකාශයෙන් මහ බැංකුව වැළැකි සිටියේ ඒ එහෙයිනි.

රජයේ බදු ආදායම නැංවිය යුතු බවට ණය ගැනීමේ දී රජය එකඟ වූ කොන්දේසිය මේ වන තෙක් ඉටු කිරීමට අසමත් වී තිබේ. එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දැඩි අවධානයට යොමු වූ බව තොරතුරුවල සඳහන් විය. වර්තමානයේ මැතිවරණ ජයග්‍රහණයන්ද, ඉහළ යන උද්ධමනය පාලනය කිරීමට කිසිදු විකල්ප ක්‍රමයක් නැතිකම නිසාද ආණ්ඩුව බදු වර්ග අඩු කරමින් සිටී. රජයේ බදු ක්‍රමය අවිධිමත් හා අක්‍රමවත් බවත් ඒනිසා භාණ්ඩ හා සේවා මිල ඉහළ යෑමත් වී තිබෙන බවත් ඇත්තකි. බදු පිට බදු පනවන තට්ටු බදු ක්‍රමය තව තවත් වැඩි කරනු විනා ආණ්ඩුව බදු ක්‍රමය සරල කිරීමට උත්සාහ නොගනී. දැන් සිදුව තිබෙන්නේ දෙපැත්තකින් ආණ්ඩුව අමාරුවේ වැටීමකි. එක පැත්තකින් 2009 අපේක්ෂිත බදු ඉලක්ක සපුරා ගත නොහැකි වී තිබේ. අනික් අතින් දේශපාලන අවශ්‍යතා හා බඩු මිල පාලනයට අසමත්ව, බදු අඩු කිරීමෙන් තවදුරටත් රජයේ බදු ආදායම් වේගයෙන් පහත බසින්නට වී තිබේ, එම පහත බැසීම හරිහැටි හෙළිවන්නේ ඊළඟ අය-වැය වන විට අතර අර්බුදය මතුවන්නේ ද එවිටය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ණය මුදලේ තුන්වන කොටස (ඩොලර් මිලියන 388) ලබාදීම 2010 මැයි වන තෙක් ප්‍රමාද කර තිබෙන්නේ මේ නිසයි. පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු මැයි වන විට අනිවාර්යයෙන් ඊළඟ අය-වැය සඳහා කඩිනමින් සූදානම් විය යුතු වේ. දැනට තිබෙන පරිපූරක කෙටි අය-වැය (සිව් මස්) බලපාන්නේ 2010 අප්‍රේල් වන තෙක් පමණි.

රජයෙන් 2009 ඔක්තෝම්බර් 21 දා ප්‍රකාශයට පත් කළ වාර්තාවකින් කියැවුණේ ගත වූ මාස දහය තුළ රජයේ බදු ආදායම රුපියල් මිලියන 132 කින් පහත වැටී ඇති බවය. 2009 සමස්ත බදු ප්‍රමාණය රුපියල් කෝටි 77910 දක්වා ඉහළ නැංවීමට රජය අපේක්ෂා කළ ද සංශෝධිත ඇස්තමේන්තුවලින් කියැවුණේ එය රුපියල් කෝටි 65780 දක්වා (එනම් රුපියල් කෝටි 2130 න්) පහත වැටී ඇති බවය. තවදුරටත් දේශීය හා විදේශීය ණය ගැනීමක් හැර ආණ්ඩුවට ඉදිරියේ වෙනත් විකල්පයක් නැති බව පැහැදිලිය. වර්තමාන ආණ්ඩුව යළි බලයට පැමිණියහොත් මින් ඔබ්බේ ඔවුනට කළ හැකි දෙයක් ඔවුන්ගේ රාජ්‍ය මූල්‍ය හා දේශපාලන ප්‍රතිපත්ති තුළ නොමැත. වඩ වඩා මුදල් නෝට්ටු මුද්‍රණය මගින් බඩු මිල ඉහළ යෑම, හෙවත් උද්ධමනය වැඩිවීම හා අය-වැය පරතරය වැඩිවීම අනිවාර්යයෙන් සිදුවනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසිවලට පටහැණි ශ්‍රී ලංකාවේ මෙම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ අවාසනාවන්ත තත්ත්වය කිසිවිටක රටේ යහපත පිණිස හේතු වන්නේ නැත. අරමුදලේ තුන්වන ණය වාරිකය නතර වීමට වඩා බොහෝ ප්‍රමාද කිරීමට ඉඩ ඇතැයි ඇතැම් ආර්ථික විද්වතුන් දැනටමත් අනතුරු අඟවා ඇත්තේ මේ හෙයිනි. 2010 අය-වැය ප්‍රමාද වන හෙයින් ඉදිරියේ රටේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කවරාකාර වේදැයි තමන් නිරීක්ෂණය කරමින් සිටින බවද ඒ අනුව 2010 මැයි වන විට ඉදිරි ණය වාරිකය පිළිබඳ තීරණයක් ගන්නා බවද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රකාශයට පත් කර ඇත.

**සකස් කළේ : මර්වින් දෙනගම**

මූලට